2024 11. 30.

පිටුව 7

ලංකාදීප

# මේ මස කොළඹ නගරවැසියන්ගේ උද්ධමනය බැහැලා

**නොවැම්බර් මාසයේ දී කොළඹ නාගරික ප්‍රජාවගේ පාරිභෝගික උද්ධමනය පහත ගොස් ඇතැයි ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව පවසයි.**

ඒ අනුව කොළඹ නාගරික ප්‍රජාවගේ පාරිභෝගික උද්ධමන අනුපාතය නොවැම්බර් මාසයේදී සියයට -2.1දක්වා අඩු වී ඇත.

ඔක්තෝබර් මාසයේ දී එය සියයට -0.8 ක් ලෙස වාර්තාවී තිබිණ.

නොවැම්බර් මාසයේදී ආහාර කාණ්ඩයේ වාර්ෂික උද්ධමනය සියයට 0.6 දක්වා අඩු වී ඇති අතර, ඔක්තෝබර් මාසයේ දී එය වාර්තා වූයේ සියයට1.0ක් ලෙසය.

එමෙන්ම, නොවැම්බර් මාසය සඳහා ආහාර නොවන කාණ්ඩයේ වාර්ෂික උද්ධමනය සියයට -3.3ක් දක්වා අඩුවී ඇති අතර එය ඔක්තෝබර් මාසයේ දී සියයට -1.6ක් ලෙස වාර්තා විය.